# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

**අති විශෙෂ**

අංක 2304/43 - 2022 නොවැම්බර් මස 02 වැනි බදාදා - 2022.11.02

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# III වැනි කොටස - ඉඩම්

## ඉඩම් රජයට ගැනීම පිළිබඳ දැන්වීම්

**ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)**

7 වැනි වගන්තිය යටතේ දැන්වීම

*මගේ යොමු අංකය:* KO/DS/AD/FIL/75.
*ඉඩම් අමාත්‍යාංශ ගොනු අංකය:* 4-3/5/2020/HW/277.

මහජන කටයුත්තක් සඳහා අවශ්‍ය පහත දැක්වෙන ඉඩම්/ පරවශතාව ලබාගැනීමට ආණ්ඩුව අදහස් කරන බැවි, 1964 අංක 28 දරන ඉඩම් අත්කර ගැනීමේ (සංශෝධන) පනතින් සංශෝධිත පරිදි ඉඩම් අත්කර ගැනීමේ පනතේ 7 වැනි වගන්තියේ (1) වැනි උපවගන්තිය යටතේ මෙයින් දැනුම් දී සිටිමි.

*ලබාගැනීමට බලාපොරොත්තුවන ඉඩමේ/පරවශතාවේ විස්තර :-*

බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, කොලොන්නාව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, අංක 510, මීතොටමුල්ල ග්‍රාම නිලධාරි කොට්ඨාසයෙහි, මීතොටමුල්ල (කොලොන්නාව නගර සභා සීමාව තුළ) ගමේ පිහිටි, සර්වේයර් ජනරාල් වෙනුවට කොළඹ දිස්ත්‍රික් ජ්‍යෙෂ්ඨ මිනින්දෝරු අධිකාරී විසින් පිළියෙල කරන ලද අංක කො 9995 දරන හා 2022.09.13 දිනැති මූලික පිඹුරෙහි ප්‍රමාණයෙන් හෙක්ටයාර 0.0079 ක් වූ කැබලි අංක 01 සිට 02 දක්වා වූ කැබලි :

01. **කැබලි අංක 01**
ඉඩමේ නම: වරිපනම් අංකය - 117/31/ඒ, මීතොටමුල්ල පාර; ඉඩමේ විස්තරය: ගෙවත්ත, ස්ථිර ගොඩනැගිල්ලක් ඇත.; හිමිකම් කියන අය: රජය; මුල් හිමිකම් කියන අය: එස්.ඩී. ලසන්ත ප්‍රියදර්ශන (අත්කර ගැනීමේ කටයුතු අවසන් කිරීම සඳහා. මූ.පි. 5239 හි 170 වන කැබැල්ලේ කොටසක්.); ප්‍රමාණය: හෙක්. 0.0060.

02. **කැබලි අංක 02**
ඉඩමේ නම: වරිපනම් අංකය සොයාගත නොහැක, මීතොටමුල්ල පාර; ඉඩමේ විස්තරය: ගෙවත්ත, මිශ්‍ර බෝග වගාවක් ඇත.; හිමිකම් කියන අය: රජය; මුල් හිමිකම් කියන අය: මීතොටමුල්ල පාරේ වරිපනම් අංක 117/31/ඒ යන ලිපිනයේ පදිංචි එස්.ඩී. ලසන්ත ප්‍රියදර්ශන විසින් භුක්ති විඳී. (ශ්‍රී ලංකා විදුලිබල මණ්ඩලයට අයත් 33 KV භූගත රැහැන් පද්ධතියක් ප්‍රතිස්ථාපනය කිරීම සඳහා ඉඩම් අත්කර ගැනීමේ ව්‍යාපෘතිය සඳහා අවශ්‍ය වී ඇත. මූ.පි. කො 8183 හි 16 වන කැබැල්ලේ කොටසක්.); ප්‍රමාණය: හෙක්. 0.0019.

ඉහත සඳහන් ඉඩමට හිමිකම්, අයිතිවාසිකම් හෝ වෙනත් සම්බන්ධකම් කියා සිටින සියලුදෙනාම තම තමන් හෝ ඔවුන්ගේ ලියවිලිවලින් බලයලත් අයවලුන් හෝ 2022 නොවැම්බර් මස 21 වැනි දින පෙ. ව. 9.30 ට කොලොන්නාව ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී මා සම්මුඛ විය යුතුයි.

තව ද, 2022 නොවැම්බර් මස 09 වැනි දිනට මත්තෙන් ඒ ඉඩම් සම්බන්ධයෙන් ඇති ඔවුන්ගේ අයිතිවාසිකම්වල ස්වභාවයන් එකී ඉඩම ලබාගැනීම ගැන වන්දි ඉල්ලීමට ඇති කරුණු පිළිබඳ විස්තරත් වන්දි මුදල හා ඒ මුදල ගණන් බැලූ ආකාරයත් මා වෙත පිටපත් දෙකක් සහිත වූ ලියවිල්ලකින් දැනුම්දිය යුතුයි.

**එම්. ඒ. පී. ජයකොඩි,**
ප්‍රාදේශීය ලේකම්,
කොලොන්නාව.

2022 ඔක්තෝබර් මස 21 වැනි දින,
කොලොන්නාව ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී ය.

EOG 11-0010

## ශුද්ධිපත්‍රය

### ඉඩම් අත්කර ගැනීමේ පනත ( 460 වැනි පරිච්ඡේදය)

### 7 වැනි වගන්තිය යටතේ දැන්වීම

*ප්‍රා.ලේ.යොමු අංකය* - BD/KK/LND/06/04.
*ඉඩම් අමාත්‍යාංශයේ යොමු අංකය* :- 4/3/2/2018/IR/497.

2022 මැයි මස 30 වැනි සඳුදා දින අංක 2282/17 දරන *ගැසට් පත්‍රයේ* 05-0161 දරන දැන්වීමේ සඳහන් දිනයන් පහත සඳහන් පරිදි සංශෝධනය වන බව දන්වා සිටිමි.

කන්දකැටිය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ අංක 32D වාසනාගම ග්‍රාම නිලධාරි වසමේ තල්පිටිගල වත්ත නැමැති ඉඩමට හිමිකම් කියා සිටින සියලු දෙනා තමන් හෝ ලියවිලිවලින් බලයගත් අයවලුන් හෝ 2022 නොවැම්බර් මස 30 වැනි දින පෙ.ව. 9.30 ට කන්දකැටිය ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී මා සම්මුඛ විය යුතුයි.

තව ද, 2022 නොවැම්බර් මස 16 වැනි දිනට මත්තෙන් ඔවුන්ගේ අයිතිවාසිකම්වල ස්වභාවයත්, ඉල්ලන වන්දි මුදල හා එය ගණන් බැලූ හැටිත් මා වෙත පිටපත් 2 ක් සහිතව ලියවිල්ලකින් දැනුම් දිය යුතුයි.

**ඩී. එම්. යූ. අයි. එන්. කේ. දිසානායක,**
ප්‍රාදේශීය ලේකම්,
කන්දකැටිය.

2022 ඔක්තෝබර් මස 27 වැනි දින,
කන්දකැටිය ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී ය.

EOG 11-0011

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.